# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2409/39 - 2024 නොවැම්බර් මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2024.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DS/IMA/LAN/05/02/31.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/18/2020/WS/244.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :-

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉමදූව ගමේ පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙල කොට ඇති කැඩැස්තර සිතියම් අංක 810343 හා 2024.08.15 දිනැති සිතියමේ කැබලි අංක 01 හා 02 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.8545 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි :

01. කැබලි අංක **1**
ඉඩමේ නම : දාවිචකනත්තහේන, මහහේන්කනත්ත සහ එක්වත්තේකනත්ත; හිමිකම් කියන්නා : ලංකා සෝමදේව මෙන්ඩිස් වලවගේ මයා; ප්‍රමාණය : හෙක් 0.7457

*උතුරට* : මුපි 1728 හි කැබලි අංක W104 (හිපි 192899), 3148 (හිපි 192900) සහ 3149 (හිපි 192901); *නැගෙනහිරට* : මුපි 1728 හි කැබලි අංක 3148 (හිපි 192900) සහ 3149 (හිපි 192901); *දකුණට* : මුපි 1728 හි කැබලි අංක 3149 (හිපි 192901), 3148 (හිපි 192900) සහ මෙම පත්‍රයේ කැබලි අංක 2; *බටහිරට* : කැබලි අංක 2 සහ මුපි 1728 හි කැබලි අංක W104 (හිපි 192899) සහ රජය හිමිකම් කියන ගීගනගේ කනත්ත.

02. කැබලි අංක **2**
ඉඩමේ නම : ගීගනගේකනත්ත; හිමිකම් කියන්නා : රජය; ප්‍රමාණය : හෙක් 0.1088

*උතුරට* : කැබලි අංක 01; *නැගෙනහිරට* : කැබලි අංක 01, මුපි 1728 හි කැබලි අංක 3148 (හිපි 192900) සහ රජය හිමිකම් කියන ගීගනගේ කනත්ත; *දකුණට* : මාර්ගය සහ රජය හිමිකම් කියන ගීගනගේ කනත්ත; *බටහිරට* : මාර්ගය සහ රජය හිමිකම් කියන ගීගනගේ කනත්ත.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 ජනවාරි මස 06 වැනි දින පෙ.ව. 10.00 ට ඉමදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය. තව ද, 2024 දෙසැම්බර් මස 16 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එස්. ඒ. එම්. නස්ලි,
ප්‍රාදේශීය ලේකම්,
ඉමදූව.

2024 නොවැම්බර් මස 04 වැනි දින,
ඉමදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0052


1A - G 043036 – 10 (2024/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*